# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1838/3 – 2013 නොවැම්බර් 25 වැනි සඳුදා – 2013.11.25**

**(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/10/03/2008.

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

අංක 1803/20 දරන හා 2013.03.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධියට පත්කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ලිමිටඩ් හි සේවය කළ කොළඹ 10, පියදාස සිරිසේන මාවත, අංක 99 හි පදිංචි එස්. ඒ. ධනසේන මහතා / හෝමාගම, මුල්ලේගම, අංක 243 හි පදිංචි එච්. විජේරත්න මහතා / පන්නිපිටිය, ඇරැව්වල, අංක 273ඒ හි පදිංචි ඊ. ඩී. ධර්මසේන මහතා සහ බොරලැස්ගමුව, ඇඹිල්ලවත්ත පාර, අංක 11/1 හි පදිංචි ආර්. තිලකරත්න මහතා ඇතුළුව අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් හතළිස් පස් දෙනා (45) හා අනෙක් පාර්ශවය වශයෙන් අතුරුගිරිය, ඔරුවල, කඩුවෙල පාර හි පිහිටි සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ලිමිටඩ් අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබාදී ඇති අංක ඒ 3291 දරන හා 2012.11.07 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ලිමිටඩ් වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක ඒ 3291 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2014.03.25 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
**කම්කරු කොමසාරිස්.**

2013 නොවැම්බර් මස 06 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 18593 – 165 (2013/11)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3 වන නියෝගය

'අ' ආකෘති පත්‍රය

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්
කම්පැණි ලිමිටඩ්,
කඩුවෙල පාර,
ඔරුවල,
අතුරුගිරිය.
2013.09.16

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2013.03.25 දිනැති අංක 1803/20 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දා වූ ද සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ලිමිටඩ් සහ එස්. ඒ. ධනසේන සහ තවත් අය බැඳී සිටින්නා වූ ද අංක A 3291 සහ 2012.11.07 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අතීක් ඉනාන්,**
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස්,
දිවුරුම් කොමසාරිස් සහ ලියාපදිංචි සමාගම් ලේකම්,
සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ්
කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ලිමිටඩ් වෙනුවෙන්

*පිටපත්* - අනෙක් පාර්ශවයට

12 – 370

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.